**කළුතර ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය වියාචනය

කළුතර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කළුතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වර්තාවේ 1.6 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වියාචනය කළ මතයක් පළ කරණු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.30 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ අස්ථිත්වය දායක වූ ප්‍රාග්ධනය සහ ණය ගැනීමේ ප්‍රමාණය දැක්විය යුතු වුවද, වර්ෂ තුළ ලද රු.10,663,787 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන රු.112,115 ක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී මුදල් ප්‍රවාහය නිවැරදිව සකස් කරන බව. | යොමුගත ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) ප්‍රමිතියේ පරිච්ඡේද අංක 6.10 සහ 6.11 ප්‍රකාරව සභාව විසින් පෙර වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂය සඳහාත් ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ගැලපීම් කර නොතිබුණි. | වත්කම් තක්සේරු කරන තෙක් ක්ෂය ගණනය කළ නොහැකි බව. | -එම-. |
| (ඇ) ප්‍රමිතියේ පරිච්ඡේද අංක 18.7 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී දේපල හා පිරියත උපකරණ ප්‍රත්‍යාගණනය කළ වටිනාකම යොදා ගැනීම ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමක් ලෙස සැලකුවද සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | වත්කම් තක්සේරුවට මුදල් ගෙවීම අපහසු බව | -එම-. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු.5,560,061 ක් වූ පුස්තකාල පොත්, දේපළ , පිරියත හා උපකරණ යටතේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ජංගම වත්කම් යටතේ තොග ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ)සමාලෝචිත වර්ෂයේ ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.10,663,787 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වනු වෙනුවට පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරිම් ලෙස ආදායමට හඳුනාගෙන තිබුණි. | -එම- | -එම- |

1.6.3 **නොසැසඳු පාලන ගිණුම් හෝ** වාර්තා

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03ක මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.259,810 ක වෙනසක් නිරික්ෂණය විය. | 2024 ගිණුම සකස් කිරිමේදි ජර්නල් සටහන් මගින් නිවැරදි කිරිමට කටයුතු කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

1.6.4 **අවිනිශ්චිත ගිණුම්**

| **විෂයය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| වසර ගණනාවක සිට පැවත එන අභ්‍යන්තර මුදල් මාරු කිරීමේ ගිණුමේ පවතින රු.1,435,668 ක බැර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව. | අවිනිශ්චිත ශේෂයන් නිරවුල් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 2022 සැප්තැම්බර් 06 දිනැති අංක 2296/05 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන ක්‍රියාත්මක නොකිරීම. | (i) නව සභා බල ප්‍රදේශය සහ සභික සංඛ්‍යාව වෙනස් වීම පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | පිළිතුරු දී නැත. | යොමුගත ගැසට් පත්‍ර යේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | | (ii)2023 මාර්තු 20 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කළුතර මහා නගර සභාවට අය වියයුතු වරිපනම් බදු ආදායම හඳුනා නොගැනීම නිසා | -එම- | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කළුතර මහා නගර සභාවට අයවිය යුතු වරිපනම් ආදායමද කළුතර ප්‍රාදේශිය සභාවේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |
| | | (iii) 2023 මාර්තු 20 දින සිට කළුතර මහා නගර සභාවට අයත් විය යුතු වත්කම් ප්‍රමාණය නිශ්චිතව හදුනාගෙන භාරදීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේත් කටයුතු කර නොතිබීම නිසා කළුතර ප්‍රාදේශීය සභාවට අයත් වත්කම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව නිරූපණය නොවුණි. | -එම- | -එම- |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය | නව වරිපනම් තක්සේරුවක් සිදු කිරීම සඳහා 2019 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී තිබුණද, ප්‍රවර්තන වර්ෂය සඳහා ද 2013 වර්ෂයේ තක්සේරුව මත බදු අයකර තිබුණි. | පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගෙන් උපදෙස් ලැබුණු විගස ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කරන බව. | යොමුගත රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | -එම- |
| (ඈ) | 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/08 දරන ගැසට් පත්‍රයේ රීති අංක 42 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | මේ වන විට සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.44,290,949 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.50,962,414 විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 9,482,276 | 9,503,429 | 13,044,149 | 8,044,149 | 9,483,183 | 9,479,741 | 8,537,184 | 12,208,751 |
| (ii) | කුලී | 257,400 | 315,400 | 315,400 | - | 270,000 | 270,000 | 294,500 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,554,600 | 1,713,750 | 1,713,750 | - | 440,000 | 415,175 | 415,175 | - |
| | | 11,294,276 | 11,532,579 | 15,073,299 | 8,044,149 | 10,193,183 | 10,164,916 | 9,246,859 | 12,208,751 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු කාල විශ්ලේෂණය අනුව වර්ෂ 03 ත් 05 ත් අතර වරිපනම් බදු හිඟය රු.2,032,961 ක්ද, වර්ෂ 05 ත් 10ක් අතර හිඟය රු.2,336,619 ක් හා වර්ෂ10 වැඩි හිඟය රු.1,039,021 ක් ද විය. | හිඟ බදු අයකර ගැනීම මේ වන විට ආරම්භ කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ආ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 61,514,857 ක් හා මුද්දර ගාස්තු රු.208,006,586 ක් විය. | 2020 වර්ෂයට අදාලව උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදේර්ශය** |
|---|---|---|
| (අ) 2022 මැයි 31 දින අවසන්වන පරිදි සභා බල ප්‍රදේශයට අයත් මාර්ග, විදුලි පහන් හා කාණු පද්ධති පිළිබඳ භූගෝලීය දත්ත පද්ධතියක් සැකසීම මගින් සිතියම්ගත කිරීම සඳහා 2022 ජනවාරි 11 දින නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සභාව ගිවිසුම්ගත වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නාගරික සංවර්ධන අධිකාරීගෙන් අදාල කාර්යය නිම කර ගෙන නොතිබූ අතර කාලය දීර්ඝ කර නව ගිවිසුම් අත්සන් කිරීමක්ද සිදු කර නොතිබුණි. | ඉතිරි බල ප්‍රදේශ සඳහා නව ගිවිසුමක් යටතේ කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | ගිවිසුම්ගත වූ පරිදි කාර්යය ඉටු කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) 2018 හා 2019 වර්ෂවල නිම කරන ලද ව්‍යාපෘති 04 ක් සඳහා ගෙවිය යුතු එකතුව රු.537,087 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයේත් නිරවුල් කර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | ණය ශේෂයන් නිරවුල් කළ යුතුය. |

3.2 **වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදේර්ශය** |
|---|---|---|
| (අ) සභාව සතු ඉඩම් 28 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් තක්සේරු කර නොතිබුණි. | පිඹුරුපත් නොමැති ඉඩම් ගොඩනැගිලි මැණුම් කටයුතු සිදුකර පිඹුරුපත් සැදීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව . | සභාව සතු වත්කම් නිවැරදිව හඳුනා ලේඛනගත කළ යුතුය. |
| (ආ) සභා බල ප්‍රදේශය තුල පවතින සුසානභූමි 17 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් හරහා පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | සුසානභූමි සභාව වෙත පවරා ගැනීමට කටයුතු යුතුය. |

3.3 **ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| (අ) 2023 ජනවාරි සිට අගෝස්තු දක්වා වීදි ලාම්පු කට්ටල හා නඩත්තු ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රු.2,571,050 ක් වැය කර තිබුණද, මිලදී ගත් භාණ්ඩ පිරිවිතරවලට අනුකූලද යන්න තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් තහවරු කර නොතිබුණි. | 2023 අගෝස්තු මාසයෙන් පසු තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා පදනම් කර ගන්නා බව. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ තහවුරුව ලබා මිලදී ගැනීම් කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ටෝනර් මිලදී ගැනිමේදී පෞද්ගලික ආයතනයක් ඉදිරිපත් කරන ලද රු.6,700 ක අවම මිල ප්‍රතික්ෂේප කර රු.43,580 ක ඉහල මිලක් ඉදිරිපත් කරන ලද පෞද්ගලික ආයතනයකට ටෙන්ඩරය ප්‍රදානය කිරීම නිසා රු.368,850 ක අලාභයයක් සිදු වී තිබුණි. | තාක්ෂණික ඇගයීම් සඳහා යොමු කර ඇති අතර එම වාර්තා ලැබීමෙන් පසුව මිලදී ගත් බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |